අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/27/15/01/2026 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2026.07. 15

සියලුම ජාතික පාසල් විදුහල්පතිවරුන් වෙත,

**<u>2026 ජාතික පාසල් ගුරු ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම</u>**

1. වාර්ෂික ගුරු ස්ථාන මාරු 2026 යටතේ ජාතික පාසල්වල ගුරුවරුන්ගේ ස්ථාන මාරු සඳහා මාර්ගගත ක්‍රමවේදයට අයදුම්පත් කැඳවීමට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තීරණය කර ඇත. මෙම මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අදාළ ව පහත උපදෙස් සංග්‍රහය පිළිබඳ අවධානය යොමු කළ යුතු ය.

   මෙම ස්ථාන මාරුවීම් ප්‍රධාන කාණ්ඩ 02 කින් සමන්විත වේ.

**1.1 <u>පළමු කාණ්ඩය : අනිවාර්ය ගුරු ස්ථාන මාරු</u>**

1.1.1 දැනට ස්ථිර ව සේවය කරන ජාතික පාසලේ 2026.12.31 දිනට සේවා කාලය වසර 08 සම්පූර්ණ කරන වයස අවුරුදු 55ට අඩු ගුරුවරුන් අනිවාර්ය ගුරු ස්ථාන මාරු ක්‍රියාවලියට යටත් වේ.

1.1.2 සේවා කාලය ගණනය කිරීමේදී පෞද්ගලික අවශ්‍යතාවයන් හේතුවෙන් ලබා ගත් තාවකාලික අනුයුක්ත වීම්, දේශීය/විදේශීය වැටුප් සහිත/රහිත නිවාඩු ආදිය ද වැටුප් ලබන පාසලේ සේවා කාලයට අයත් ලෙස සැලකිය යුතුය.

**1.1.3 අනිවාර්ය ගුරු ස්ථාන මාරු සඳහා යටත් වුව ද කිසියම් ගුරුවරයකු නියමිත දිනට මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්ථාන මාරු අයදුම් කර නොමැති නම්, විදුහල්පති විසින් TTB/2026/02 හා TTB/2026/03 ආකෘති සම්පූර්ණ කර තම නිර්දේශ සහිත ව යොමු කළ යුතු ය. මෙම තොරතුරු මත එම ගුරුවරුන් හට ස්ථාන මාරු ලබා දීම ගුරු මාරු මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.**

**1.2 <u>දෙවන කාණ්ඩය : වාර්ෂික ස්ථාන මාරු</u>**

1.2.1 පළමු කාණ්ඩයට අයත් නොවන නමුත් තම අවශ්‍යතා මත ස්ථාන මාරු අපේක්ෂා කරන ගුරුවරුන්ට ද අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

2. <u>www.nstt.moe.gov.lk</u> දිගුව ඔස්සේ මාර්ගගත ව ගුරු ස්ථාන මාරු අයදුම්පත සම්පූර්ණ කර, එහි මුද්‍රිත පිටපත විදුහල්පති වෙත තමා විසින් ම භාර දිය යුතු ය. මේ සඳහා TTB/2026/I/T උපදෙස් පත්‍රිකාවේ පියවර අනුගමනය කරන්න.

2.1. මාර්ගගත ව ගුරු ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාල සීමාව 2026.07.16 දින සිට 2026.07.30 දින දක්වා වේ. ගුරුවරයා විසින් එහි මුද්‍රිත පිටපතෙහි තම අත්සන හා දිනය යොදා 2026.07.31 දින හෝ එදිනට පෙර හෝ විදුහල්පති වෙත භාර දිය යුතු ය.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister +94112784832 +94112784825 minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary +94112784811 +94112785162 secretary.education@moe.gov.lk moesecretaryoffice@gmail.com

3. විදුහල්පති වෙත මාර්ගගත ව යොමු වී ඇති අයදුම්පත් සම්බන්ධයෙන් ඔබගේ නිර්දේශ www.nstt.moe.gov.lk දිගුව ඔස්සේ Login as a principal පිවිසුම හරහා මාර්ගගත ව යොමු කළ යුතු ය. මේ සඳහා TTB/2026/I/P උපදෙස් පත්‍රිකාවේ පියවර අනුගමනය කරන්න.

3.1 ගුරු ස්ථාන මාරු අයදුම්පත් සඳහා මාර්ගගත ව විදුහල්පති නිර්දේශ ලබා දීමේ අවසන් දිනය 2026.08.03 වේ. මෙහි දී විදුහල්පති නිර්දේශ සහිත ආකෘතියේ මුද්‍රිත පිටපතෙහි තම අත්සන, දිනය හා නිල මුද්‍රාව තබා සහතික කර ස්ථාන මාරු අයදුම්පතේ ගුරුවරයාගේ අත්සන යොදා ඇති පිටුවට පසු පිටුව ලෙස ඇමිණිය යුතු ය.

4. 2026.07.16 සිට 2026.07.30 දින දක්වා මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්ථාන මාරු අයදුම් කරන ලෙස ගුරුවරුන් දැනුවත් කිරීම, අන්තර්ජාල පරිගණක පහසුකම් ලබා දීම හා ගුරුවරයා විසින් ම තම ස්ථාන මාරු අයදුම්පතේ මුද්‍රිත පිටපත අත්සන් කර 2026.07.31 දින හෝ එදිනට පෙර විදුහල්පති වෙත භාර දිය යුතු බවට ගුරුවරුන් දැනුවත් කිරීම විදුහල්පතිගේ වගකීමකි.

5. එක් එක් ගුරුවරයාගේ ස්ථාන මාරු අයදුම්පත සමඟ පහත ලේඛන අමුණා තිබිය යුතු බවට ගුරුවරුන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතු වේ.

(i) ගුරුවරයාගේ මුල් පත්වීම් ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත

(ii) වර්තමාන සේවා ස්ථානයට ස්ථාන මාරු ලැබූ ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත

(iii) 2026 වර්ෂයේ පෞද්ගලික කාලසටහනේ විදුහල්පති සහතික කළ පිටපත

(iv) පත්වීම් විෂයය නොවන විෂයයන් උගන්වන්නේ නම් ඒ සඳහා වන ඉහළ ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකමට අදාළ සහතිකවල සහතික කළ පිටපත

(v) වෛද්‍ය කරුණු ඉදිරිපත් කිරීමට ඇත්නම්, රජයේ රෝහලක හෝ ලියාපදිංචි පෞද්ගලික රෝහලක හෝ රෝගියාට ප්‍රතිකාර කරනු ලබන විශේෂඥ වෛද්‍යවරයා විසින් නිර්දේශ කරන ලද TTB/2026/05 ආකෘතිය

(vi) TTB/2026/I/T උපදෙස් පත්‍රිකාවේ 7.2.6 යටතේ දක්වා ඇති පරිදි අනුයුක්ත තොරතුරු සියල්ල ඇතුළත් කිරීමට අවකාශ නොලැබෙන විට විදුහල්පති සහතික කළ අනුයුක්ත තොරතුරු පිළිබඳ ආකෘතිය

(vii) ආගමික ස්ථාන භාරව කටයුතු කරන පූජ්‍ය පක්ෂය (විහාරාධිපති, මීසම්භාර පියතුමන්) ඒ බව තහවුරු කළ හැකි සහතිකය

(viii) වෙනත් ආයතන වලට අනුයුක්තව රාජකාරි කරන්නේ නම් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ලබා දුන් අනුමැතිය

(ix) විදේශ නිවාඩු අනුමත වී ඇත්නම් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ලබා දුන් අනුමැතිය

විදුහල්පති නිර්දේශ සහිතව මුද්‍රිත පිටපත ඇමිණීමට පෙර ගුරුවරයාගේ අයදුම්පත සමඟ ඉහත ලේඛන අමුණා ඇති බවට තහවුරු කර ගැනීමට සැලකිලිමත් විය යුතුය.

6. විදුහල්පති විසින් ගුරු ස්ථාන මාරු අයදුම්පත් ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාවට භාර දීම සම්බන්ධ උපදෙස්

6.1 ඔබ පාසලට අයත් ගුරු ස්ථාන මාරු අයදුම්පත් කට්ටලය භාර දීමේ දී පහත උපලේඛන ද අනුපිළිවෙලින් අමුණන්න.

(i) TTB/2026 උපලේඛනය - පිරික්සුම් ලැයිස්තුව

(ii) TTB/2026/01 උපලේඛනය - ස්ථාන මාරු අයදුම්පත් යොමු කරනු ලබන සියලු ම ගුරුවරුන්ගේ තොරතුරු (www.nstt.moe.gov.lk) දිගුව ඔස්සේ Login as a principal පිවිසුම මගින් පිවිස සියලුම අයදුම්පත් සඳහා නිර්දේශ ලබා දීමෙන් පසුව Download transfer request list හරහා මෙම උපලේඛනය ලබා ගත යුතු ය.)

(iii) TTB/2026/02 උපලේඛනය - තම පාසලේ සේවය කරනු ලබන 2026.12.31 දිනට වසර 08 ක් හෝ ඊට වැඩි හෝ සේවා කාලයක් සහිත වයස අවුරුදු 55 ට අඩු මාර්ගගත ක්‍රමය ඔස්සේ ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කර නොමැති ගුරුවරුන්ගේ නාම ලේඛනය (මේ යටතේ ගුරුවරුන් නොමැති අවස්ථාවල දී ඒ බව සටහන් කළ යුතු ය.)

(iv) TTB/2026/03 උපලේඛනය - තම පාසලේ සේවය කරනු ලබන 2026.12.31 දිනට වසර 08 ක් හෝ ඊට වැඩි හෝ සේවා කාලයක් සහිත වයස අවුරුදු 55 ට අඩු ගුරුවරුන් අතරින් මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කර නොමැති ගුරුවරුන් හට ස්ථාන මාරු ලබා දීම සඳහා ගුරු ස්ථාන මාරු මණ්ඩලය වෙත යොමු කරන ආකෘති

(v) TTB/2026/04 උපලේඛනය- data.moe.gov.lk දිගුව ඔස්සේ යාවත්කාලීන කළ පාසලේ ගුරු ඌනතා හා අතිරික්තතා ලේඛනය

7. 2026 ගුරු ස්ථාන මාරු සම්බන්ධ ව විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් සඳහා වන උපදෙස් සංග්‍රහයන් මේ සමග යොමු කරමි. ඉන් ගුරුවරුන් සඳහා වන උපදෙස් සංග්‍රහය ඔබ පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමටත්, ගුරු මණ්ඩලය දැනුවත් කර ලොග් සටහනක් තැබීමටත් කටයුතු කළ යුතු ය.

8. සියලු අයදුම්පත් ගොනු 2026.08.03 දින සිට 2026.08.10 දින දක්වා කාල සීමාව තුළ අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව වෙත විදුහල්පතිවරයා හෝ බලය පවරන ලද නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරයකු විසින් හෝ ගෙනැවිත් භාර දිය යුතු ය. තව ද අයදුම්පතේ පිටපතක් අදාළ ගුරුවරයාගේ පෞද්ගලික ලිපි ගොනුවට යොමු කිරීම සඳහා කලාප අධ්‍යාපන කාර්යාලය වෙත යැවිය යුතු ය.

9. විදුහල්පතිවරුන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව වෙත ගෙනැවිත් භාර දෙන සියලු ම අයදුම්පත් ශාඛාවේ විෂය භාර නිලධාරියා විසින් පරීක්ෂා කොට මාර්ගගත පද්ධතියේ සටහන් කිරීම සිදු කරනු ලැබේ.

10. **පහත දැක්වෙන නිලධාරීන් අතුරින් ඔබ පාසලට අදාළ නිලධාරියා / නිලධාරිනිය අමතා අයදුම්පත් භාර දීමට පහසු දිනයක් හා වේලාවක් වෙන් කර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.**

| | |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය ( සිංහල මාධ්‍යය) | මධුෂානි මිය |
| ගම්පහ දිස්ත්‍රික්කය ( සිංහල මාධ්‍යය) | ජයනෙත්ති මිය |
| කළුතර දිස්ත්‍රික්කය ( සිංහල මාධ්‍යය) | පුෂ්පා මිය |
| ගාල්ල දිස්ත්‍රික්කය ( සිංහල මාධ්‍යය) | අසංක මයා |
| මාතර/හම්බන්තොට දිස්ත්‍රික්ක (සිංහල මාධ්‍යය) | දේවන්ති මිය |
| වයඹ පළාත ( සිංහල මාධ්‍යය) | ගයනි මිය |
| ඌව පළාත ( සිංහල මාධ්‍යය) | ශ්‍යාමලි මිය |
| මධ්‍යම පළාත ( සිංහල මාධ්‍යය) | හේමමාලි මිය |

| | |
|---|---|
| උතුරු මැද පළාත ( සිංහල මාධ්‍යය) | ලලිත් මයා |
| උතුරු නැගෙනහිර පළාත ( සිංහල මාධ්‍යය) | පුෂ්පා මිය |
| සබරගමුව පළාත ( සිංහල මාධ්‍යය) | සමරසිංහ මිය |
| දෙමළ මාධ්‍යය පාසල් | වාසුකි මිය |

ගුරු මාරු ශාඛාවේ දුරකථන අංකය වන 0112784434 හා 0112784991 ඇමතීමෙන් තොරතුරු ලබා ගත හැකිය.

11. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2026.08.10 දිනට පසු ව ලබා දෙන අයදුම්පත් භාර නොගන්නා බැවින් එදිනට පෙර ඔබ පාසලට අයත් අයදුම්පත් කට්ටල ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව වෙත භාර දීමට කටයුතු කරන්න.

12. අදාළ උපදෙස්වලට පරිබාහිර ව ගුරුවරුන් පුද්ගලික ව රැගෙන එන හෝ තැපැල මගින් යොමු කරන හෝ කිසිදු අයදුම්පතක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත භාර ගනු නොලැබේ. පුද්ගලික ව යොමු කරන සියලුම ලේඛන කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සම්බන්ධව ගුරුවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

13. මේ සමඟ පහත ඇමුණුම් ඔබ වෙත යොමු කරමි.

- (i) මාර්ගගත ව ගුරු ස්ථාන මාරු අයදුම්පත පිරවීමට ගුරුවරුන් සඳහා උපදෙස් (TTB/2026/I/T)
- (ii) මාර්ගගත ව ගුරු ස්ථාන මාරු අයදුම්පත් සඳහා නිර්දේශ ලබා දීම හා ස්ථාන මාරු අයදුම්පත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කළ යුතු ආකාරය පිළිබඳ විදුහල්පතිවරුන් සඳහා උපදෙස් (TTB/2026/I/P)
- (iii) ජාතික පාසල් ගුරු ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම - 2026 යටතේ වූ උපදෙස් සංග්‍රහය (පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම සඳහා)
- (iv) TTB/2026 උපලේඛනය - පිරික්සුම් ලැයිස්තුව
- (v) TTB/2026/02 උපලේඛනය
- (vi) TTB/2026/03 උපලේඛනය
- (vii) TTB/2026/05 උපලේඛනය

14. වැඩිදුර උපදෙස් හෝ යම් ගැටළුවක් පවතී නම් හෝ රාජකාරි කාලය තුළ පහත දුරකථන අංකවලට අමතන්න.

| | |
|---|---|
| මාර්ගගත ක්‍රමය ඔස්සේ ගුරු ස්ථාන මාරු අයදුම් කිරීමේ දී තාක්ෂණික ගැටළුවක් පවතී නම් දත්ත කළමනාකරණ ශාඛාව ඇමතීමට | 011-2075854 |
| ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව ඇමතීමට | 011-2784434,011-2784991 |

ඒ.ජේ.එස්.එස්.එදිරිසූරිය
අතිරේක ලේකම් (ආයතන )
ලේකම් වෙනුවට